Ministry of Youth and Sports | SRI LANKA Youth | UN VOLUNTEERS Sri Lanka | World Health Organization Sri Lanka | UNDP

# මාධ්‍ය නිවේදනය

## තරුණ ප්‍රජා නායකත්ව ප්‍රාරම්භය MAS ඇතීනාහිදී 2022 ජාත්‍යන්තර සාම දිනය සමරයි.




**2022 සැප්තැම්බර් 21, තුල්හිරිය, ශ්‍රී ලංකාව:** ජාතික තරුණ සේවා සභාවේ (NYSC) ඒකාබද්ධ වැඩසටහනක් වන තරුණ ප්‍රජා නායකත්ව ප්‍රාරම්භය (YCLI) විසින්, ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවය (UNV) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ එක්ව 2022 සැප්තැම්බර් 19 සිට 21 දක්වා තුල්හිරිය MAS ඇතීනා පරිශ්‍රයේදී 'YCLI සාම දින සැමරුම' පවත්වන ලදී. සෑම වසරකම සැප්තැම්බර් 21 වැනි දින සමරනු ලබන ජාත්‍යන්තර සාම දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකාව ද එක්වන අතර මෙවර MAS ඇතීනා සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකාවේ සෑම දෙසින්ම පැමිණි තරුණ තරුණියන් 500කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම සැමරුම පැවැත්විණි.

තරුණ තරුණියන් සඳහා විශේෂ යොවුන් පාර්ලිමේන්තු සැසියක්, සාම ගම්මානයක් සහ සාම උත්සවයක් ඇතුළු විවිධ ක්‍රියාකාරකම් රැසක් මෙම තෙදින උත්සවයෙහිදී පැවැත්විණි. එමගින් ශ්‍රී ලංකාවේ තරුණ නායකයින්ට ඔවුන්ගේ ප්‍රජාවන්හි යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා ක්‍රියාකාරකම්වල යෙදීමට වේදිකාවක් සකසා දෙන ලදී.

පළමු දිනයේදී, සියලුම හවුල්කාර ආයතනවල නියෝජිතයෝ ඔවුන්ගේ කැපවීම නැවත ඉදිරිපත් කරමින් සාම දින ප්‍රතිඥාවට අත්සන් කිරීම සඳහා එක්වූහ. තරුණයින්ට ඔවුන්ගේ ප්‍රජාවේ කටයුතුවලට සහභාගී වීමට අවස්ථාව ලබා දීම සහතික කිරීම එහි අරමුණ විය. අර්ථවත් තරුණ සහභාගීත්වය මගින් අදහස් කරනු ලබන්නේ සමාජ සහජීවනය, තිරසාර සංවර්ධනය සහ ප්‍රජා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමයි.

ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව අදහස් දක්වමින්, ජාතික තරුණ සේවා සභාවෙහි සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් බ්‍රිගේඩියර් ආචාර්ය තිරාන් ද සිල්වා මෙසේ පැවසීය: "ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා ක්‍රියාකාරී තරුණ සහභාගීත්වය ඉතා වැදගත්. එය අගයමින් ජාතික තරුණ සේවා සභාව තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හිදී තරුණ තරුණියන්ට වැඩි වගකීමක් ලබා දෙමින් ප්‍රතිසංස්කරණ සිදු කර තිබෙනවා. ඔවුන්ට අධීක්ෂණ කටයුතු ද පවරා තිබෙනවා. භාෂා ප්‍රවීණතා සහ තාක්ෂණික නිපුණතා අනුව පාඨමාලා විෂයමාලාවන් හඳුන්වා දීමෙන් ද අපි තරුණ තරුණියන්ට සහාය වෙනවා. ඉගෙනීමට සහ ප්‍රජාවට සේවය කිරීමට ඇති සියලු අවස්ථාවන් ප්‍රයෝජනයට ගන්නා ලෙස අපි තරුණයන්ගෙන් ඉල්ලා සිටිනවා."

සමරු උත්සවය තරුණ ප්‍රජා නායකත්ව ප්‍රාරම්භය (YCLI) ව්‍යාපෘතියේ කොටසක් වන අතර එමගින් සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන ප්‍රවර්ධනය කරනු ලැබේ. සෞඛ්‍ය ප්‍රවර්ධනය, තිරසාර සංවර්ධනය සහ ස්වේච්ඡා ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම සහතික කරන අතරම, සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා තරුණ තරුණියන්ට වෙනසක් සිදුකරන්නන් ලෙස සහභාගී වීමට හැකියාව ද එමගින් ලබාදෙයි.

සමස්ත ඒකාබද්ධ ප්‍රාරම්භය අමතමින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකාව සඳහා වන මහජන සෞඛ්‍ය පරිපාලක වෛද්‍ය ෂලාලා අහමඩෝවා මෙසේ පැවසුවාය: "ලෝක සෞඛ්‍ය සංවිධානයෙහි අධ්‍යක්ෂ ජනරාල් ටෙඩ්රොස් ගෙබ්‍රෙයෙසුස් විසින් සඳහන් කරන ලද පරිදි, 'සාමය නොමැතිව සෞඛ්‍යයක් තිබිය නොහැකි අතර සෞඛ්‍යය නොමැතිව සාමයක් පැවතිය නොහැක.' සාමය සඳහා වන බොහෝ ගෝලීය සෞඛ්‍ය මුලපිරුම් මගින් මෙය සංකේතවත් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් සවිබල ගැන්වීම මගින් සමාජ සහජීවනය සක්‍රීය කිරීම සඳහා සෞඛ්‍යය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර තිබෙනවා. එවැනි ක්‍රියාවන්හිදී, ප්‍රජාවන් ශක්තිමත් කිරීම සඳහා සෞඛ්‍යය සම්බන්ධ මැදිහත්වීම් භාවිතා කිරීමේදී යෞවනයන් ඔවුන්ගේ කුසලතා උපයෝගී කරගනිමින් එහි මධ්‍යම භූමිකාව ඉටුකරනවා. එබැවින්, මෙම ජාත්‍යන්තර සාම දිනයේදී මෙම තරුණ පිරිස එකට එකතු වෙනවා දක්නට ලැබීම මට විශාල සතුටක්.

තරුණ ප්‍රජා නායකත්ව ප්‍රාරම්භය අනාගත මැදිහත්වීම් ශ්‍රී ලංකාව පුරා සිටින ප්‍රජාවන් සහ එහි ජනතාව තුළ සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරනු ඇතැයි මට බලාපොරොත්තු සහගත විය හැකිය.”

MAS ඇතීනා සත්කාරකත්වය දරන තාරුණ්‍යය සෞඛ්‍ය සහ සාමය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය මෙම අවස්ථාවේදී උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. මෙම ඒකකය සාමාන්‍ය ජනතාව සඳහා ඉගෙනුම් සහ සංවර්ධන කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කරමින් වාර්ගික පසුබිම් තුළ තිරසර සාමය, සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරනු ඇත. අතථ්‍ය යථාර්ථ සාම කෞතුකාගාරය (Virtual Reality Peace Museum), සාමය ප්‍රවර්ධනය කරන ඩිජිටල් ක්‍රීඩා අවකාශයක් සහ සාමය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා දේශීය මුලපිරීම්වලට සහාය වන ප්‍රකාශන, වාර්තා, ඉගෙනුම් සම්පත්, ජාලකරණ විස්තර සහ අනෙකුත් සම්පත් සහිත දැනුම ගබඩාවක් ද ඇතුළත් වේ.

සහයෝගීතාවයේ වැදගත්කම අවධාරණය කරමින් MAS ෆැබ්රික් පාක්හි ප්‍රධාන විධායක නිලධාරී සුමින්ද ද සිල්වා මහතා මෙසේ පැවසීය: “ජාත්‍යන්තර සාම දිනය සැමරීම සඳහා මෙම අවස්ථාවට සහයෝගය දැක්වීමට ලැබීම අපට ගෞරවයක්. MAS සැමවිටම සහයෝගී දැනුම කේන්ද්‍රස්ථානයක අවශ්‍යතාවය හඳුනාගෙන සිටින අතර, නිර්මාණශීලීත්වය දිරිගැන්වීම සහ අවබෝධය ශක්තිමත් කිරීම වෙනුවෙන් මිනිසුන්ට එකිනෙකා සමඟ අන්තර් ක්‍රියා කළ හැකි වේදිකාවක් සැපයීමට MAS වෙහෙස නොබලා කටයුතු කළා. සාමය සහ සංවර්ධනය ඇති කිරීම වෙනුවෙන් අපගේ සමාජය තුළ ධනාත්මක වෙනසක් ගෙන ඒම සඳහා හවුල්කරුවන් සමඟ දිගින් දිගටම හයෝගයෙන් කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.”

සාම දින සැමරුම මගින් තරුණ ප්‍රජා නායකත්ව මුලපිරුමට සහභාගිවූවන් හට වැඩසටහන තුළදී ඔවුන් ලබාගත් දැනුම ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාව ලබාදෙන ලදි. උත්සවයේදී පවත්වන ලද යොවුන් පාර්ලිමේන්තු විවාද සැසිවාර හරහා සියල්ලන් ඇතුළත් කරගන්නා, තිරසාර හා සමානාත්මතාවය කේන්ද්‍ර කරගත් ජාතික තරුණ ප්‍රතිපත්තියක් නිර්දේශ කිරීමට ද අවස්ථාවක් ලබාදෙන ලදි. ශ්‍රී ලංකාවේ තාරුණ්‍යය, සාමය සහ ආරක්ෂාව න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයාම සම්බන්ධයෙන් අදහස් දක්වමින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය නේවාසික නියෝජිත මලින් හර්විග් මහත්මිය මෙසේ ප්‍රකාශ කළාය: “වෙනසක් සඳහා සහ ධනාත්මක ක්‍රියාමාර්ග සඳහා තාරුණ්‍යයට ඇති හැකියාව බොහෝ දුරට ප්‍රයෝජනයට ගෙන නැහැ. ප්‍රජා සහභාගීත්වය සහ ක්‍රියාකාරී පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා, සමාජ සහජීවනය සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණයින්ට ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ක්‍රියාත්මක වීමට අවස්ථාවන් සහ පුහුණු පහසුකම් සැලසීම සහතික කළ යුතුයි.”

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවයෙහි (UNV ) දේශීය සම්බන්ධීකාරක ෂාර්මලී ජයසිංහ මහත්මිය මෙසේ අදහස් පළ කළාය: “සියලු ජාතීන්ගේ වර්තමානය සහ අනාගතය වෙනුවෙන්, අපි තරුණ

පරපුර ජාතියක උතුම්ම වස්තුවක් ලෙස හඳුනාගත යුතුමයි. තරුණ ස්වේච්ඡා සේවකයන් බිම් මට්ටමේ ප්‍රජාවන්ට සහාය දක්වන පළමු ප්‍රතිචාර දක්වන්නන් ලෙස බොහෝ විට ඉදිරියෙන්ම සිටින ආකාරය අපි වසර ගණනාවක් තිස්සේ අත්දැක තිබෙනවා. ස්වේච්ඡා සේවය ඔස්සේ, යෞවනයන් ඇතුළත් කරගනිමින් සාමකාමී සමාජයන් නිර්මාණය කිරීමට අත් අයව දිරිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවය තරුණ ප්‍රජාවට දිගටම සහාය වනු ඇති.”

****අවසානයි****

අපගේ සබැඳි

WHO Sri Lanka | Facebook | UNDP Sri Lanka | Facebook | UN Volunteers - Sri Lanka | Facebook

**වැඩිදුර විස්තර සඳහා අමතන්න:** info@unvlk.org or +94 (0) 11 2580691-7